# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,983 - 2016 සැප්තැම්බර් මස 02 වැනි සිකුරාදා - 2016.09.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1708 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1710 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1711 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1714 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1718 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1719 |

*සැ. යු. - ලක් ජනසෙත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජුනි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.*

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 සැප්තැම්බර් මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 සැප්තැම්බර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1707 - B 81094 - 5,403 (2016/08)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීම සංශෝධනය කිරීම

මුල්‍ය පහසුකම් සමග උඩරට දුම්රිය මාර්ගයේ මෙහෙයුම් සඳහා රෝලින් ස්ටොක් ප්‍රසම්පාදනය ඩීසල් ඉලෙක්ට්‍රික් ලෝකොමොටිව් ගණනින් 12ක්

ප්‍රසම්පාදන අංක : SRS/ F. 7335

2016.08.05 වැනි දින පළ කරන ලද අංක 1979 *ගැසට් පත්‍රයේ* 08-07 දැන්වීම හා බැඳේ.

02. ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල සෙත්සිරිපාය අදියර II හි, 7 වන මහලේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලිපිලේඛන නිකුත් කිරීමේ අවසාන දිනය සහ ලංසු භාරගැනීම අවසාන කරන/විවෘත කරන දිනය දීර්ඝ කර ඇත.

* ලිපිලේඛන නිකුත් කරන අවසාන දිනය : 2016.09.15
* ලංසු භාරගන්නා අවසාන දිනය/විවෘත කරන දිනය: 2016.09.19

03. වැඩිදුර විස්තර සඳහා කරුණාකර අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10.
දුරකථන අංකය : 94 (11) 2438078/2436818
ෆැක්ස් අංක : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com

සභාපති,
අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද
ස්ථාවර ප්‍රසම්පදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

යොමු අංකය : SRS/F.7335

09-69

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන නිවේදනය

**එකක් කි. ග්‍රෑ. 1200ක් වන විදුලිය කේබල් ඩ්‍රම් 03ක් සහ අඩි 14ක් දිග සංඥ කණු ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත ප්‍රවාහනය කිරීම සඳහා බූම් ට්‍රක් රථ එකක් ප්‍රසම්පාදනය කිරීම**

එකක් කි. ග්‍රෑ. 1200ක් වන විදුලිය කේබල් ඩ්‍රම් 03ක් සහ අඩි 14ක් දිග සංඥ කණු ප්‍රවාහනය කිරීම සඳහා බූම් ට්‍රක් රථ එකක් සැපයීම පිණිස කොළඹ තැ. පෙ. 355, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයෙහි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලබයි.

02. ලංසු භාරගැනීම කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවා සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී 2016.09.15 දින ප. ව. 2.00 ට අවසන් වෙයි.

03. ලංසු ඉදිරිපත් කළ යුත්තේ රු. 3,000 ක ආපසු ගෙවනු නොලබන ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් 2016.09.14 වැනි දින ප. ව. 3.00 දක්වා ලබාගත හැකි පෝර්මවල පමණි.

04. ලංසු විවෘත කිරීම, ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයෙහි, ශ්‍රී ලංකා දුම්රිය සේවා සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී සිදු කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ අවසරලත් නියෝජිතයින්ට ලංසු විවෘත අවස්ථාවට පැමිණෙන ලෙසට ආරාධනය කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් අතින් ගෙනැවිත් භාර දිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම ගාස්තු ගෙවීමකින් තොරව ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී සිදුකළ හැකි ය.

07. වැඩිදුර විස්තර සඳහා විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10.
දුරකථන අංකය : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94(11) 2432044
ඊමේල් : srs. slr@gmail.com

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7296

09-167

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීම සංශෝධනය කිරීම

**මූල්‍ය පහසුකම් සමග උඩරට දුම්රිය මාර්ගයේ මෙහෙයුම් සඳහා රෝලින් ස්ටොක් ප්‍රසම්පාදනය ඩීසල් මල්ටිපල් යුනිට් ගණනින් 9 ක්**

ප්‍රසම්පාදන අංක : SRS/F.7336

2016.08.05 වන දින පළ කරන ලද අංක : 1979 ගැසට් පත්‍රයේ 08-06 දැන්වීම හා බැඳේ.

02. ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර II හි, 7 වන මහලේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලිපිලේඛන නිකුත් කිරීමේ අවසාන දිනය සහ ලංසු භාරගැනීම අවසාන කරන / විවෘත කරන දිනය දීර්ඝ කර ඇත.

* ලිපිලේඛන නිකුත් කරන අවසාන දිනය : 2016.09.14

* ලංසු භාරගන්නා අවසාන දිනය/විවෘත කරන දිනය : 2016.09.15

03 වැඩිදුර විස්තර සඳහා කරුණාකර අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරී
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10.
දුරකථන අංකය : 94(11) 2438078 / 2436818
ෆැක්ස් අංක : 94(11) 2432044
ඊමේල් : srs.slr@gmail.com

සභාපති,
අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද
ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

යොමු අංක : SRS/F.7336

09-70

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ධාවන බල උප දෙපාර්තමේන්තුවේ දුර සේවා දුම්රිය මැදිරි අභ්‍යන්තර පවිත්‍රතා හා ජැනිටෝරියල් සේවා ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංක :SRS/F, 7373

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කට් මාවත, කොළඹ 10 විසින් මාලිගාවත්ත දුම්රිය අංගනයේ සහ හයිඩ්‍රොලික් ලොකොමෝටිව් ෂෙඩ්/ජෝන් හොලන්ඩ් S-11 DMUU අංගනයේ දුර සේවා දුම්රිය මැදිරිවල අභ්‍යන්තර පවිත්‍රතා හා ජැනිටෝරියල් සේවා වසර දෙකක කාලයක් සඳහා සැපයීමට දැනට රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන සඳහා පවිත්‍රතා හා ජැනිටෝරියල් සේවා සපයන ප්‍රමාණවත් පළපුරුද්දක් ලබා ඇති පිළිගත් ආයතනවලින් ලංසු භාරගනු ලැබේ.

02. කොළඹ 10, ඕල්කට් මාවතෙහි පිහිටි දුම්රිය සේවා අධිකාරී කාර්යාලයෙන් ලබාගත් ලංසු පත්‍රිකා මගින් පමණක් 2016.09.20 දින ප.ව. 03.00 දක්වා රු. 3,000.00 ක ආපසු නොගෙවන ලංසු ගාස්තුවක් ගෙවීමෙන් ලංසු ඉදිරිපත් කළ හැක.

03. 2016.09.21 දින ප.ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතෙහි පිහිටි ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තු සාමාන්‍යාධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

04. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවීමට හෝ ගෙනැවිත් භාරදීමට කටයුතු කළ යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

05. ලංසු ලිපි ලේඛන කොළඹ 10, ඕල්කට් මාවතෙහි පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී මුදල් ගෙවීමකින් තොරව පරීක්ෂාකර බැලිය හැක. වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් නිලධාරි තැන අමතන්න.

දුම්රිය සේවා අධිකාරී
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත,
කොළඹ 10.
දුරකථන අංක :2438078 හෝ 2436818
ෆැක්ස් අංක :2432044

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංක : SRS/F.7373

09-168/1

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු සඳහා ආරාධනයයි

**තලෙයිමන්නාරම, මුරුන්කන්, අලිමංකඩ හා පල්ලෙයි හි දුම්රිය ස්ථානාධිපති බංගලා ඉදිකිරීම**

ප්‍රසම්පාදන අංක : SRS/F.7420

කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, තලෙයිමන්නාරම, මුරුන්කන්, අලිමංකඩ හා පල්ලෙයි හි දුම්රිය ස්ථානාධිපති බංගලා ඉදිකිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින්, මුදා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා උපලේඛනගත වූ අයකු නොවිය යුතු අතර, ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ C5 හෝ ඉහළ ශ්‍රේණියක, ගොඩනැගිලි වැඩ පිළිබඳ විශේෂඥතාවයෙන් යුත්, ලංසු භාර ගැනීම අවසන් කරනු ලබන දිනය වන විට වලංගු ලියාපදිංචිය සතුවිය යුතුය. තවද, එම ලියාපදිංචිය, ලංසු ප්‍රදාන දිනයේ ද වලංගුව තිබිය යුතුය.

03. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 6,000/- ගෙවීමෙන්, 2016.09.22 වැනි දින පස්වරු 3.00 දක්වා, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුවේ.

04. ලංසු භාර ගැනීම, 2016.09.23 වැනි දින පෙරවරු 10.00 ට අවසන් කෙරේ.

05. ලංසු, මුදාතබා, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

දුම්රිය ගබඩා අධිකාරි,<br>
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,<br>
තැ.පෙ. 1347,<br>
ඕල්කොට් මාවත,<br>
කොළඹ 10.

06. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ඉහත 5 ඡේදයේ සඳහන් ලිපිනයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

07. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ, අංක 01, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා වැඩ) කාර්යාලයේ, ප්‍රධාන ඉංජිනේරු (ගොඩනැගිලි) වෙතින් ලබාගත හැක.

මේ සම්බන්ධ පෙර - ලංසු හමුවක් 2016.09.09 වැනි දින පෙරවරු 10.00ට ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා වැඩ) කාර්යාලයේදී පැවැත්වීමට නියමිතය.

කොන්ත්‍රාත් අංක - දුරකථන/ෆැක්ස් : 0112695863.

08. කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී, ඕනෑම රාජකාරි දිනයක 09.00 පැය හා 16.00 පැය අතර කාලය තුළ, ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.

දුරකථන අංක : 94(11)2438078 හෝ 94(11) 2436818<br>
ෆැක්ස් : 94(11) 2432044

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7420

09-168/2

---

# බඩු බාහිරාදිය විකිණීම්

**මහාධිකරණය - වවුනියාව**

වවුනියාව මහාධිකරණ විනිසුරුතුමාගේ නිල නිවසෙන් ගලවාගත් භාවිතා කරන ලද උලු තුන්දහක් (3,000) 2016.09.28 වැනි දින පස්වරු 3.00 ට වවුනියාව මහාධිකරණ විනිසුරුතුමාගේ නිල නිවාසයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙම අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම මහජනතාවට මෙම භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක.

02. ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

03. මෙම භාණ්ඩ මිලදීගත් වහාම අදල මුදල ගෙවා නිල නිවාසයෙන් ඉවත් කර යුතුය. ගෙවීම් සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

04. මෙම භාණ්ඩ මිලදී ගන්නා අය තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

බී. සසී. මහේන්ද්‍රන්,
මහාධිකරණ විනිසුරු,
වවුනියාව.

2016 අගෝස්තු මස 09 වැනි දින,
මහාධිකරණය,
වවුනියාව.

09-32

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - 2017 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසිවලටත් යටත් ව 2017 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිලදී ගැනීම සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් 2016 සැප්තැම්බර් 22 වැනි දින පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි අතර, නියමිත ආකෘති පත්‍රයෙන් යුතු ටෙන්ඩර් පෝරමයකින් විය යුතු ය.

*(ආ)* ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක පහත උපලේඛනයෙහි දැක්වෙන පරිදි ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබාගන්නා ලද නිල කුවිතාන්සිය, සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතික ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථොක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි සැලකිළිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එහි සඳහන් ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පතේ අංකය ද යෙදිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක් ම ටෙන්ඩර් පෝර්මය සමඟ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර, වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර දැමිය යුතු ය. තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීම සඳහා නියමිත වේලාව ඉක්මවීමට පෙර, වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එහි සඳහන් වේලාවට ටෙන්ඩර්කරුවන් වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. මෙම මුදල ප්‍රාදේශීය ලේකම් නමින් නිල්දණ්ඩාහින්න මහජන බැංකුවේ වාර්ෂික ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට ටෙන්ඩර්කරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් 'ගෙවීම සඳහා යන්න' සටහන් කරන ලද චෙක්පතින් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත්" ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත්කොට, කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දුවන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩර් පතක් කිහිපදෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන් පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත්, ඒවා 2016.11.10 වැනි දින පෙරවරු 10.30ට මෙම ස්ථානයේ දී විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. ටෙන්ඩ විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම්, වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම් (වැඩ බලන),
වලපනේ.

2016 අගෝස්තු මස 11 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය* | *රා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටු වියයුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගන්නා දිනය හා අවසාන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|
| අංක 04 | හරස්බැද්ද | හරස්බැද්ද ග්‍රාමය තුළ | 2016.09.22 පෙ. ව. 10.30 | 5,000.00 |
| අංක 05 | පදියපැලැල්ල | පදියපැලැල්ල ග්‍රාමය තුළ | 2016.09.22 පෙ. ව. 10.30 | 5,000.00 |

09-34

## කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

රා තැබෑරුම් රේන්දය විකිණීම - 2017 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2017 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2016.09.27 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සියක් ; සහ

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැළකිලිමත් විය යුතු ය :

(a) ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.
(b) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.
(c) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.
(d) සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග තමන්ගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සියක්, වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''නියමිත තැබෑරුම් අංකය සහ නම'' සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපැලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ''යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර, ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුළු මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් රා තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2016.11.03 වැනි දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්.
කොත්මලේ.

2016 අගෝස්තු මස 12 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| *රා තැබෑරුම් :* | | | |
| අංක 1 - කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2016.09.27 පෙ. ව. 10.30 | 5,000 |
| අංක 2 - ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයකට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු ය. | 2016.09.27 පෙ.ව. 10.30 | 5,000 |
| අංක 3 - කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2016.09.27 පෙ. ව. 10.30 | 5,000 |

09-39/1

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් සංස්ථාපනය කිරීම

සමාගමේ නම : ඉන්ෂුවර්මි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 114473
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 135/3/1/1, කිරුළ පාර, කොළඹ 05
සංස්ථාපනය කිරීමේ දිනය : 2016.06.17

ලේකම්.

09-02

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පී. එස්. ජේ. ට්‍රේඩිං ප්‍රයිවට් ලිමිටඩ් සමාගම 2016 ජුනි 28 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : පී. එස්. ජේ. ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 114672
සංස්ථාගත කළ දිනය : 2016.06.28
ලියාපදිංචි ලිපිනය : අංක 130/48, බේස්ලයින් පාර, සීදූව උතුර, සීදූව.

ලේකම්වරු.

09-36

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාතර, රාහුල හරස් පාර, අංක 13/5 හි පදිංචි සන්ධ්‍යා කුසුම් ධම්මිකා අමරසිංහ වන මා විසින් කඹුරුගමුව, ''කෙත්සිරි'' හි පදිංචි නන්දකුමාර බෙනට් අමරසිංහ යන අය වෙත බලය පවරමින්, ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. ජී. නිලූකා මහත්මිය විසින් වර්ෂ 2016 ජනවාරි මස 02 වැනි දින ලියා සහතික කරන ලද අංක 1171 දරන ඇටර්නි බලපත්‍රය 2016.08.08 දින සිට අවලංගු කරන බවත්, එකී ඇටර්නි බලකරු ලෙස සිදුකරන කිසිදු ක්‍රියාවන්ට හා හට වගකීමක් නොමැති බව ද මෙයින් දැනුම් දෙමි.

සන්ධ්‍යා කුසුම් ධම්මිකා අමරසිංහ.

09-85

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහරගම, පන්සල පාර, අංක 130/5 ඒ හි පදිංචි කොළඹහේවාගේ දීප්ත කළණ (ජාතික හැඳුනුම්පත් අංක 782613430 වී) වන මම ප්‍රසිද්ධ නොතාරිස් නීතිඥ ඒ. කීර්තිරත්න මහතා විසින් ලියා සහතික කරන ලද අංක 2872 සහ 2013.02.21 දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් මහරගම, පන්සල පාර, අංක 130/5 ඒ හි පදිංචි විතානගේ දුලීපා ලක්ෂාණි විජේසේන වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රසිද්ධ කරමින් අවලංගු කරන අතර ඇය විසින් මා වෙනුවෙන් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමක් නොදරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

කොළඹහේවාගේ දීප්ත කළණ.

2016 අගෝස්තු මස 15 වැනි දින දී ය.

09-101

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහරගම, පන්සල පාර, අංක 130/5 ඒ හි පදිංචි කොළඹහේවාගේ දීප්ත කළණ (ජාතික හැඳුනුම්පත් අංක 782613430 වී) වන මම ප්‍රසිද්ධ නොතාරිස් නීතිඥ ඒ. කීර්තිරත්න මහතා විසින් ලියා සහතික කරන ලද අංක 2662 සහ 2012.01.24 දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් මහරගම, පන්සල පාර, අංක 130/5 ඒ හි පදිංචි විතානගේ දුලීපා ලක්ෂාණි විජේසේන වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රසිද්ධ කරමින් අවලංගු කරන අතර ඇය විසින් මා වෙනුවෙන් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමක් නොදරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

කොළඹහේවාගේ දීප්ත කළණ.

2016ක් වූ අගෝස්තු මස 15 වැනි දින දී ය.

09-102

---

## සීමිත වගකීමෙන් යුතු සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මහජනයා වෙත කරනු ලබන දැනුම් දීමයි

සමාගමේ නම : රිසර්ච් සර්විසස් ඇන්ඩ් සොලුෂන්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක : පී වී 115486
සංස්ථාගත කරන ලද දිනය : වර්ෂ 2016 අගෝස්තු මස 03 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 262/1, කොහල්විල පාර, දළුගම, කැලණිය.

වාසලතන්ත්‍රිගේ මෙරීනා දිනාලි දිල්රුක්ෂිකා පෙරේරා,
සමාගම් ලේකම්.

2016 අගෝස්තු මස 12 වැනි දින.

09-103

---

## මහජනතාවට දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනත අනුව පහත සඳහන් සමාගම් පුද්ගලික සමාගම් ලියාපදිංචි සහතිකය ලබා සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙමි.

සමාගම් නාමය : ජේසර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 113854
සංස්ථාගත කළ දිනය : 2016 මැයි 24
ලිපිනය : No. 83/2/16, Emirates Plaza Building, First Gross Street, Colombo 11.

09-104

---

## සමාගමක් ලියාපදිංචි කිරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව කෙරෙන ප්‍රසිද්ධ දැන්වීමයි

සමාගමේ නම : කෙයාරා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 891/එච්/1, ඔබවත්ත, හෙයියන්තුඩුව
ලියාපදිංචි අංකය : පී වී 115558
සංස්ථාපිත දිනය : 2016 අගෝස්තු 05

09-110

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සීමිත වගකීම් සමාගමක් ලෙස 2016 අගෝස්තු මස 09 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ෆැෂන් පාර්ක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 115626
ලියාපදිංචි ලිපිනය : අංක 1, ගම්පොල පාර, බැක් ලේන්, නාවලපිටිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. එස්. එස්. ඇසොසියේට්ස්.

දුරකථන අංක : 077 2340581/077 - 3362880/081-2351985.

09-111

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 දරන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කරන ලද බව දැනුම්දීමයි.

සමාගමේ නම : ඉරෝගාඩ් සෙකියුරිටි සර්විසස් (පී. වී. ටී.) එල්ටීඩී
ලියාපදිංචි අංක : පී වී 115033
ලිපිනය : අංක 204, බොරළුල්ල පාර, දෙපානම, පන්නිපිටිය
දිනය : 2016.07.14

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

සමාගම් ලේකම්.

09-118

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

ඉන්දියාවේ, මුම්බායි 400042, කන්ජූර්මාර්ග් (E) කන්ජූර්මාර්ග් දුම්රියපළ ඉදිරිපිට, ජේ. වී. එල්. ආර්. වෙතින් හැරී 1 - තින්ක් ටෙක්නෝ කැම්පස් ''ඒ'' ගොඩනැගිල්ල බේටා, අංක 3 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි ඉන්දියාවේ සංස්ථාගත කොට ඇති සමාගමක් වන හහීල් ඉන්ඩියා ප්‍රයිවට් ලිමිටඩ් හි කළමනාකාර අධ්‍යක්ෂක වන, ඉන්දියාවේ 400076, මුම්බායි, පොවායි, හිරනන්දනී හි, හිරනන්දනි ගාඩ්න් හි රිච්මන්ඩ් ගොඩනැගිල්ලේ, 09 වන මහලේ, ෆ්ලැට් අංක 901 හි පදිංචි ජර්ගන් වුල්ෆ් වන මා විසින්, 2012.04.13 දිනැතිව, මුල්ලේරියාව, උඩුමුල්ල, රාජසිංහ මාවතේ, අංක 482/15 හි නුවන් සමීර සමරක්කොඩි යන අය වෙත පවරන ලද ඇටර්නි බලපත්‍රය, එහි අන්තර්ගත සියලු බලතල හා අධිකාරී බලය ඇතුළත්ව අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, රජයට හා මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

ජර්ගන් වුල්ෆ්,
කළමනාකාර අධ්‍යක්ෂක,
(මා විසින් ඉන්දියාවේ දී අත්සන් තබන ලදී.)

09-119

## ඇටෝර්නි බලය අවලංගු කිරීමේ නිවේදනය

අම්බලන්ගොට, වාදුරුප්ප, අංක 433/ඒ හි පදිංචි වික්‍රමසුරේන්ද්‍ර ආචාරිගේ චතුර ධනුෂ්ක (ජා. හැ. අංක 802642920 V) වන මම ප්‍රසිද්ධ නොතාරිස් දිලිප් හර්ෂ විතාරණ මහතා විසින් ලියා සහතික කළ අංක 23 සහ 2016.01.08 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් මාගේ ඇටෝර්නි බලකරු ලෙස කටයුතු කිරීමට අහංගම, තිත්තගල්ල, මාවැල්ල පදිංචි සමන් ජයවික්‍රම විජේතුංග (ජා. හැ. අංක 720953749V) යන අයට ලබාදුන් බලය මෙයින් අවලංගු කරන අතර එකී ඇටෝර්නි බලපත්‍රය මත ඇටෝර්නි බලකරු විසින් සිදුකරන කිසිදු ක්‍රියාවකට මා වගකීමෙන් නොබැඳෙන බව ද කියා සිටිමි.

වික්‍රමසුරේන්ද්‍ර ආචාරිගේ චතුර ධනුෂ්ක.

2016 අගෝස්තු මස 16 වැනි දින දී ය.

09-135

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ජනරජයේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වඩමුන්නේ ගෙදර නඩලගමුවේ පදිංචි වී සිට දැනට කුවේට් රාජ්‍යයේ ෂල්වා අංක 05 වීදියේ ඉලොන් 07 නිවාස අංක 156 හි පදිංචි ජයසුන්දර මුදියන්සේලාගේ නිශාන්ත ජයසුන්දර මා විසින් මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හිඳගල ගලහා පාර අංක 31/3 දරන ස්ථානයේ පදිංචි වලිවිටගේ ලින්ටන් පීරිස් නමැති අයට ප්‍රදානය කරන කුවේට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දෙවන ලේකම් විසින් සහතික කරන ලද වර්ෂ 2016 ක් වූ මාර්තු මස 27 වැනි දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2016ක් වූ ජූලි මස 12 වැනි දිනෙන් අවලංගු කර ඇති බව මහජනතාවට සහ ශ්‍රී ලංකා රජයට මෙයින් දැනුම් දෙමි. තව ද, මෙම දිනයේ පසුව මේ සම්බන්ධව යම් ක්‍රියාවක් කළ ඇත්නම් එයට මා වග නොකියන බව දන්වමි.

ජයසුන්දර මුදියන්සේලාගේ නිශාන්ත ජයසුන්දර.

09-140

---

## සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය N (PVS) 6037

සමාගම පරිවෘත කිරීමේ සහ ඈවරකරු නිදහස් කිරීමේ දැන්වීම

සමාගමේ නම : සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : එම්අයිසීඑච් ගොඩනැගිල්ල, අංක 27, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (සිවිල්) 56/2013/CO

ඇවරකරුගේ නම : ජී. ජේ. ඩේවිඩ්
SJMS ඇසෝසියේට්ස් බාරේ
ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම
4 වන මහල, අංක 02, (දැනට 3 වන මහල, අංක 11)
කාසල් පටුමග, කොළඹ 04.

සමාගම පරිවෘත
කිරීමේ සහ ඇවරකරු
නිදහස් කිරීමේ දිනය : 2016.07.28

09-143

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීමේ නිවේදනය මෙයින් ප්‍රකාශයට පත් කෙරේ.

සමාගම් නාමය : ආර්. ඩබ්ලිව්. අයි. ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 115291
සංස්ථාපනය කරන ලද දිනය : 2016 ජූලි මස 27
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 45, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02.

බිස්නස්මෙට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 45, බ්‍රේබෲක් පෙදෙස,
කොළඹ 02.

09-145

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ජනහිත මක්ක්‍රො කෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය හා දිනය : පී වී 115551 - 2016.08.05
ලියාපදිංචි ලිපිනය : අංක 78, මාදේයියාව, කැගල්ල.

සමාගමේ නම : ශ්‍රී ලක්මායා කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය හා දිනය : PV 115754 - 2016.08.15
ලිපිනය : අංක 15 ඒ, පොල්ගහවෙල පාර, රන්වල, කැගල්ල.

සමාගම් ලේකම්.

09-162

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 02, හුණුපිටිය, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, අංක 72/5, දරන ස්ථානයේ පෙර පදිංචිව සිටි දැනට කොළඹ 02, නවම් මාවත, වැකන්ද ජාතික නිවාස සංකීර්ණයේ අංක 19 දරන ස්ථානයේ පදිංචි හෙට්ටි ආරච්චිගේ රංජිත් (ජා. හැ. ප. අංක 591890565 වී) වන මා විසින් කොළඹ 02, නවම් මාවත, වැකන්ද ජාතික නිවාස සංකීර්ණයේ, අංක 19, දරන ස්ථානයේ පෙර පදිංචි දැනට අංක 62/10, ඩෝසන් වීදිය, කොළඹ 02 දරන ස්ථානයේ පදිංචි හෙට්ටි ආරච්චිගේ චන්ද්‍රලතා (ජා. හැ. ප. අංක 586710575 වී) වෙත බලය පවරමින් නුගේගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඇඹුල්දෙනිය මහතා විසින් සහතික කරන ලද අංක 521 සහ 2009.02.02 දිනැති ඇටෝර්නි බලපත්‍රය 2016.08.01 දින පටන් බලපැවැත්වෙන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන බව ශ්‍රී ලංකා ජනරජයට සහ මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ. එබැවින් 2016.08.01 වැනි දිනට පසුව ඉහත කී හෙට්ටි ආරච්චිගේ රංජිත් වන මා විසින් හෝ මා වෙනුවෙන් හෝ මාගේ අවසරය පිට යැයි සඳහන් කරමින් කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වගකීමක් නොමැති බව ද විශේෂයෙන් දන්වා සිටිමි.

හෙට්ටි ආරච්චිගේ රංජිත්.

2016 අගෝස්තු මස 15 වැනි දින.

09-169

---

## සමාගමක් සංස්ථාපිත කළ බවට ප්‍රසිද්ධ කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ලක්සවිය ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

ලියාපදිංචි අංකය : පී වී 115519
ලියාපදිංචි කාර්යාලය : අංක 540/18/01, මාදිවෙල පාර, තලවතුගොඩ.

09-174

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදේශ මත්පැන් තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2017 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුලුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2016.09.28 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් විය යුතු ය.

*(ආ)* ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර නිල කුවිතාන්සියක් ; සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැළකිලිමත් විය යුතු ය :

*(a)* ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

*(b)* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

*(c)* සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

*(d)* සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග තම ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''නියමිත තැබෑරුම් අංකය සහ නම'' සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ''යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර, ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වාර්ෂික ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2016.11.08 වැනි දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේ දී නැවත විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්.
කොත්මලේ.

2016 අගෝස්තු මස 12 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| *විදේශ මැත්පැන් තැබෑරුම :* | | | |
| අංක 2 - පුණ්ඩළුඔය | පුණ්ඩළුඔය නගරය ඉහල කඩ වීදිය | 2016.09.28 පෙ. ව. 10.30 | 5,000 |

09-39/2

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ජාතික ඉතිරිකිරීමේ බැංකුව - පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 8136 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ. අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුව තුළ මීගමුව මහනගර සභා සීමාව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ පලගතුරෙයිහි 75 (ඒ) දරන ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ පලගතුරෙයි බටහිර පිහිටි පෝරුතොට පාරේ තක්සේරු අංක 351 දරන ''පයුරුගහවත්ත සහ දෙඹගහවත්ත'' යන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. මෙන්ඩිස් විසින් මැන සාදන ලද 2008.02.08 දිනැති මිනින්දෝරු සැලසුම් අංක 4127/ඒ දරන පිඹුරේ දැක්වෙන බෙද වෙන් කළ බිම් කට්ටිය වන, අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් දෙළහයි දශම දෙක (අක්. 1, රූ. 3, පර්. 12.2) ක විශාලත්වයක් ඇති ලොට් අංක 1 නමැති ඉඩම, ගස් හා වගාවන් සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 1030/48 වෙළුම/පිටුව (ජී 09/20 වෙත ගෙන යන ලද) යටතේ ලියාපදිංචි වී ඇත.

තවද, මෙකී දේපළට ඇතුලුළුවීම සඳහා එම්. ඩී. එඩ්වඩ් බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 194 දරන 1992.02.12 දිනැති පිඹුරේ දැක්වෙන ලොට් අංක 12 හි මාර්ග අයිතිය ද සමග වේ.

*දේපළ වෙත පිවිසීම.*- කොළඹ සිට මහනුවර ඒ 1 ප්‍රධාන පාරේ කැලණිය පාලම පසුකර වම්පසට පැලියගොඩ- පුත්තලම ඒ 3 ප්‍රධාන පාර පිහිටා ඇත. මෙම පාරේ කිලෝමීටර් 31.4ක් පමණ ගියපසු පෙරියමුල්ල මංසන්ධිය හමුවේ. එතැනින් වමට කිලෝමීටර් 1.6ක් දුරින් අඩිනිවාස් පාර සහ කනත්ත පාර පසුකර ''ලිවිස් ප්ලේස්'' හමුවේ. ''ලිවිස් ප්ලේස්'' සහ පෝරුතොට පාරේ (කොච්චිකඩේ දෙසට) කිලෝමීටර් 2.4ක් දුරින් අදළ දේපළ දකුණු පසින් පිහිටා

ඇත. එම ස්ථානය මීගමුව නගරයේ සිට කිලෝමීටර් 4.3 ක් සහ කොළඹ කොටුවේ සිට කිලෝමීටර් 41.4 ක් පමණ දුරින් පිහිටා ඇත.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවට සහ පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී වෙත ඔනර්ස් ක්ලබ් ඉන්ටර්නැෂනල් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් උකස්කරන ලදුව ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ අප විසින් 2016 සැප්තැම්බර් මස 22 වැනි දින (බ්‍රහස්පතින්ද) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) බද්ද,
3. ගැණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාරක ප්‍රතිශතයක්) වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතු ය.
4. ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ සහ සෝෂකකරුගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000,
7. ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා 2016.08.19 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* හෝ 2016.08.19 වැනි දින දිනපතා පුවත්පත් වන ඩෙලිනිව්ස්, දිනමිණ, තිනකරන්, ලක්බිම සහ සුඩර් ඔලි පුවත්පත් බලන්න.

වැඩි විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා කරුණාකර අමතන්න. සහකාර සාමාන්‍යාධිකාරි, ආයතනික මූල්‍ය ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක 011 2577994.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නැවැත්වීමේ /අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණරත්න.

'ටී ඇන්ඩ් එච් ඔක්ෂන්',
තුසිත් කරුණාරත්න,
අංක 182/3 (50/3),
විහාර මාවත,
කොළොන්නාව.

දුරකථන අංක : 0113 - 068185, 0112 - 572940
ෆැක්ස් අංක : 0112 - 572940, 0112 - 685776
ඊමේල් : tandhauction@gmail.com

09-144

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් - පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, අම්බලන්ගොඩ නගර සභා සීමාවේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 75 එෆ් දරන බටපොල බටදූව ග්‍රාම නිලධාරී වසමේ බටපොල පිහිටි ඉසමදාවත්ත ඕවිට (අංක 118953 දරන මූලික පිඹුර) සහ ඇත්බස්නාවේ වත්ත ඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එම්. පී. සිල්වා විසින් මැන සාදන ලද අංක 1192 ඒ සහ 1994.11.12 වැනි දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද කැබලි අංක 1 බී දරන බිම් කොටස.

ප්‍රමාණය : (අ. 0, රූ. 0, පර්. 21) පර්චස් විසි එකක්

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සැම සියලු දේත් සමගය. මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 4/100 දරන වෙළුම/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1481 සහ 2014.03.25 වැනි දින දරන උකස් බැදුම්කරය ප්‍රකාරව ඉහත උපලේඛනයේ හි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය බන්ධනදයි වශයෙන් තුයියා හැන්නැදිගේ සරත් කුමාර යන අය බන්ධනදයි වශයෙන් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැදුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්ධනදයි විසින් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2016ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින පෙ. ව. 11.00 ට අදාල දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - බටපොළ නගරයේ සිට මීටියාගොඩ පාරේ කි. මී. 1.5ක් පමණ 7 වන කණුව දක්වා ගමන් කර එතැන් සිට මීටර් 400 පමණ ගමන් කළ විට අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),

04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හෝ සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව.

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242 යුනියන් පෙදෙස, කොළඹ 02. දුරකථන අංක 011-4218743

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා
අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ,
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200,
හල්ස්ඩ්‍රොෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 077 - 3181891.

09-114

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් - පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, අම්බලන්ගොඩ නගර සභා සීමාවේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාගරික කොට්ඨාස අංක 1, පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරි වසමේ. පටබැඳිමුල්ලේ පිහිටි කහටගහවත්ත හෙවත් ලිඳමුල්ලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. ගාල්ලගේ විසින් මැන සාදන ලද අංක 1935 සහ 1995.06.11 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද කැබලි අංක 1සී 2 දරන බිම් කොටස.

ප්‍රමාණය : (අ. 0, රූ. 0, පර්. 7.93) පර්චස් හතයි දශම නවයයි තුනක්.

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 256/86 දරන වෙළුම/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

02 ඉහත කී පටබැඳිමුල්ලේ පිහිටි කහටගහවත්ත හෙවත් ලිඳමුල්ලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. පී. එස්. ගුණවර්ධන විසින් මැන සාදන ලද අංක 2100 සහ 1990.06.08 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද කැබලි අංක 1 බී 2 දරන බිම් කොටස.

ප්‍රමාණය (අ. 0, රූඩ් 0, පර්. 9.8) පර්චස් නවයයි දශම අටක්.

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 256/87 දරන වෙළුම/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමට පහත විස්තර කරන ඉඩම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

ඉහත කී පටබැඳිමුල්ලේ පිහිටි කහටගහවත්ත හෙවත් ලිඳමුල්ලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. පී. එස්. ගුණවර්ධන විසින් මැන සාදන ලද අංක 2100 සහ 1990.06.08 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද කැබලි අංක 1එෆ් දරන බිම් කොටස.

ප්‍රමාණය (අ. 0 රූ. 0 පර්. 2.25) පර්චස් දෙකයි දශම දෙකයි පහක් විශාල ඉඩම. මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 256/85 දරන වෙළුම/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මුදියන්සේලාගේ ඇන්ටනට් රෝමනී තලවත්ත විසින් සහතික කරන ලද අංක 341 සහ 2013.08.02 වැනි දින දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව මගින් ඉහත උපලේඛනයේ හි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය බන්ධනදයී වශයෙන් ඩෙල්ටා සරත් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සහ උකස්කරු වශයෙන් එකී හැලඹගේ කුසලානි යන අය බන්ධනදයි වශයෙන්, කොළඹ 02 යුනියන් පෙදෙසේ අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්ධනදයී විසින් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2016ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින ප. ව. 1.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - අම්බලන්ගොඩ බස් නැවතුම්පොල සිට කොළඹ පාරේ යාර 100ක් පමණ ගමන් කර වමට හැරී පරණ කොළඹ පාරට පිවිස තවත් යාර 100ක් පමණ ගමන් කර 2 වැනි හරස්

වීදියට පැමිණෙන්න. එතැනින් වමට හැරී තවත් යාර 75ක් පමණ ගමන් කළ විට දකුණට හැරී එතැන් සිට තවත් යාර 50ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හෝ සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242 යුනියන් පෙදෙස, කොළඹ 02. දුරකථන අංක 011-4218743.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ
සහ දිසා අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200,
හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක 077 - 3181891.

09-113

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කොළඹ කොටුව ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීමයි

මෙම දේපළ රත්මලාන සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ව්‍යාපාර ලියාපදිංචි අංක එන් පී වී 2326 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන (කලින් ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 1206 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ) ටී මාස්ටර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ තෙලවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එන්. අම්බලවානර් විසින් සාදන ලද 1956.06.15 දිනැති අංක 111 දරන සැලැස්මේ නිරූපනය වන තිස්ස මාවත වරිපනම් අංක 16 දරන ලේඩි කැතරින් ග්‍රූප් නමැති එහි පිහිටි ගොඩනැගිල්ල සමග ඉඩමේ ලොට් 75 ලකුණු කළ බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස එකී අංක 111 දරන සැලැස්ම අනුව පර්චස් විසි දෙකයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 22.5) ක් විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තෙලවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එන්. අම්බලවානර් විසින් සාදන ලද 1956.06.15 දිනැති අංක 111 දරන සැලැස්මේ නිරූපනය වන තිස්ස මාවත වරිපනම් අංක 16 දරන ලේඩි කැතරින් ග්‍රූප් නමැති එහි පිහිටි ගොඩනැගිල්ල සමග ඉඩමේ ලොට් 69 බී ලකුණු කළ බෙද වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස එකී අංක 111 දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20)ක් විශාල ඉඩම.

පහත සඳහන් මාර්ගය තුළ උඩින් සහ යටින් මාර්ග අයිතිය සමග.

පෙර කී තෙලවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. අම්බලවානර් විසින් සාදන ලද 1956.06.15 දිනැති අංක 111 දරන සැලැස්මේ නිරූපනය වන ලේඩි කැතරින් ග්‍රූප් නමැති ඉඩමේ ලොට් 74 (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස එකී අංක 111 දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් තිස් අටක් (අ. 0 රූ. 0 පර්.38)ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2016 සැප්තැම්බර් මස 20 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට ගාලු පාර ඔස්සේ රත්මලාන බොරුපන දක්වා පැමිණ වම්පසට ඇති බොරුපන පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් කි. මී. 1.2 ක පමණ දුරක් ගොස්

දකුණු පසට ඇති තිස්ස මාවතට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 100 ක පමණ දුරක් ගිය විට අදාල දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම. - *රජයේ ගැසට් පත්‍රයේ* 2014.03.07 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප, ඩේලිමිරර් පුවත්පත්වල 2014.02.24 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2014.02.19 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසි කරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණිමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණිමේ දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණිමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න* : ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03. දුරකථන අංක : 011-2456482, 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක 011- 3068185, 011- 2572940.

09-121

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

දර්ශනී එන්ටර්ප්‍රයිසස් ඇන්ඩ් ටයර් සෙන්ටර්.
ගිණුම් අංක : 0187 1000 0650.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2016 මැයි 26 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි හතලිස් හත් ලක්ෂ අනූ හත් දහස් තුන්සිය අසූ හයයි ශත පනස් හතක (රු. 24,797,386.57) මුදල ද, 2016 මැයි මස 06 වැනි දින සිට අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි විසි නම ලක්ෂ හැට හත් දහස් හයසියයක (රු. 22,967,600) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2016.08.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2016.08.23 දින ''දිවයින'' සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2016.09.23 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කොට්ඨාසය තුළ කටුගම්පොල හත්පත්තුවේ, කිනියාම කෝරළේ බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සහ බෝවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බෝවත්ත ග්‍රාමයේ පිහිටි ''සියඹලගහමුල වත්ත සහ සියඹලගහ වත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා යන අය විසින් සාදන ලද 2007 දෙසැම්බර් මස 15 දාතම හා අංක 5922 බී දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 03 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : විල නැගෙනහිරට, මෙහි ලොට් 04 සහ 06 දකුණට : හලාවත සිට කුරුණෑගල දක්වා ප්‍රධාන පාර සහ මෙහි ලොට් 06 බස්නාහිරට : මෙහි ලොට් 02 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හයයි දශම හයයි නවයක් (අ. 0, රූ. 0, පර්. 36.69) විශාල ඉඩම්

කොටස සමග එකී අංක 5922 බී දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව එච් 04/94 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-161

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී - ත්‍රිකුණාමලය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති 1971 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජීවනරේඛා ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොරළේගෙදර ධනුෂ්කා රසාදරී, කොකුහැන්නැදිගේ චන්දන අනුර කුමාර, කොකුහැන්නැදිගේ සංජීව අනුර කුමාර යන අයවලුන් විසින් පැහැර ඇති බැවින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලය මත පහත සඳහන් දේපළ පිළිවෙලින් දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### 1 වන වෙන්දේසිය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දූනගහපත්තුවේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳවල ග්‍රාමයේ දිමුතු මාවතේ පිහිටි වරිපනම් අංක 257 දරන පිඹුරු අංක 1030 හි ලොට් 2 ලෙස දක්වෙන පොත්තෝදේවත්ත නමින් හඳුන්වන අගනා පර්චස් 22ක් විශාලැති දේපළ සහ පරිශ්‍රය වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ය වන මාර්ගය.* - මීගමුව කටාන මාර්ගයේ වයි මංසන්ධිය දක්වා කි. මී. 1.5 දකුණට පිහිටා ඇති ජේ. ජී. ඕ. ජාත්‍යන්තර විදුහල දක්වා ගමන් කර දකුණට හැරී මීටර් 10ක් පමණ ගමන් කර ත්‍රිත්ව පාරේ ජාත්‍යන්තර පාසැල පිටිපස පිහිටා ඇති වාහන ගමන් කළ හැකි පාරේ මීටර් 40ක් පමණ ගමන් කිරීමෙන් මෙම පාරේ දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

#### 2 වන වෙන්දේසිය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොල්ගොල්ල ඉහළ විසිදෙකේ කෝරළේ හිරියාල හත් පත්තුවේ උඩතම්මිට ගනිමුල්ල සහ පොල්ගොල්ල දරන ස්ථානයේ පිහිටි පොල්ගොල්ලවත්ත යන නමින් හඳුන්වන අංක 62ඒ/88 දරන පිඹුරෙහි සඳහන් පරිදි මැන බෙදා වෙන් කරන ලද කැබලි අංක 67 දරන ප්‍රමාණයෙන් පර්චස් 18 විශාලැති අගනා දේපළක් වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින ප. ව. 1.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ය වන මාර්ගය.* - කුරුණෑගල නගරයේ සිට දඹුල්ල පාරේ කි. මී. 16ක් පමණ පොල්ගොල්ල නැෂනල් වත්ත දක්වා ගමන් කොට දකුණට පිහිටා ඇති 3 වන පටුමගට හැරී මීටර් 75ක් පමණ ගමන් කිරීමෙන් මෙම පාරේ දකුණින් මෙම දේපළ පිහිටා ඇත. (සියලුම මාර්ගවල වාහන ගමන් කළ හැකියි.)

#### 3 වන වෙන්දේසිය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ත්‍රිකුණාමල නගර සහ කඩවත් සතර සහ ත්‍රිකුණාමල ප්‍රාදේශීය සභා සීමාව තුළ පලායියුතු අංක 243 ඩී ග්‍රාම සේවා නිලධාරී වසමේ කොට්ඨාස අංක 5 දරන පළායියුතු ග්‍රාමයේ පිහිටා වරිපනම් අංක 143 නුවර පාර (LHS) දරන ස්ථානයෙහි පිහිටි සර්වේයර් ජනරාල්වරයා විසින් සාදන ලද FVP 15 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 960 ලෙස දැක්වෙන පළායියුතු යන නමින් හඳුන්වනු ලබන ප්‍රමාණයෙන් පර්චස් 19 ක ඉඩම සමග එයට අදාළ සියලු අයිතිවාසිකම් ද වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දින පෙ. ව. 11.15 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ය වන මාර්ගය.* - ත්‍රිකුණාමල නගරයේ සිට නුවර පාර ඔස්සේ කි. මී. 2.5ක් (පළතුත්තු වටරවුමේ සිට මීටර් 150ක් පමණ) ගමන් කිරීමෙන් පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

#### 4 වන වෙන්දේසිය

ත්‍රිකුණාමල නගර සභා සීමාව තුළ අභයපුර ග්‍රාමයේ, අනුරාධපුර නුවර පාරේ III පටුමගේ වරිපනම් අංක 58A දරන පරිශ්‍රයේ පිහිටි නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ත්‍රිකුණාමල නගර සහ කඩවත් සතර තුළ ත්‍රිකුණාමල නගර සභා සීමාවේ පිහිටි අභයපුර අංක 244 N ග්‍රාම සේවා නිලධාරී වසමේ කොට්ඨාස අංක 12 දරන අභයපුර ග්‍රාමයේ අනුරාධපුර-නුවර පාරේ III පටුමගේ පිහිටා ඇති වරිපනම් අංක

58 A දරන පරිශ්‍රය පිහිටි රුඩ් 01, පර්චස් 3.5ක් විශාල ඉඩම සහ එයට අදළ සියළු අයිතිවාසිකම් ද වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දින පෙ. ව. 11.30ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.* - ත්‍රිකුණාමල නගරයේ සිට නුවර පාර ඔස්සේ කි. මී. 2.7ක් (පළතුත්තු වටරවුමේ සිට මීටර් 450ක් පමණ) ගමන් කර නැවත වමට හැරී තවත් මීටර් 450ක් පමණ ගමන් කිරීමෙන් පාරේ දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද සහ වැට් බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 5,000ක් ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

**5 වන වෙන්දේසිය**

ත්‍රිකුණාමල වරාය සංකීර්ණය තුළ තබා ගබඩා කර හෝ නවතා ඇති අගනා අංග සම්පූර්ණ බහුදින ධීවර යාත්‍රාවක්

ධීවර නෞකාව සමග ධීවර උපකරණ, හල් ඇංජිම, උපකරණ, ධීවර යාත්‍රාවේ වර්ග ප්‍රමාණය දිග සහ පළල අඩි 40" බිම්-අඩි 14' 06" ඩිසයින්ඩ් ඩ්‍රාෆ්ට් 3-3 එන්ජින් අංක SMD 4 AFSHSL 62" එන්ජින් වර්ගය SLELIG හෝස් පවර් 73 HP හඳුනාගැනීමේ/ලියාපදිංචි අංකය IMUL - A - 0388 CHW/SBY 55, ධීවර යාත්‍රාවේ වර්ගය මල්ටි ඩේ ෆිෂිං වෙසල්.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති 1972 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජීවනරේඛා ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොරළේගෙදර ධනුෂ්කා රසාදරී, කොකුහැන්නැදිගේ චන්දන අනුර කුමාර, කොකුහැන්නැදිගේ සංජීව අනුර කුමාර සහ කොකුහැන්නැදිගේ චමිලා අරුනශාන්ති යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලය මත වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දින පෙ. ව. 11.45 ට යාත්‍රාව තබා නවතා ඇති ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) සම්පූර්ණ ගැණුම් මුදල ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද, වේ. සම්පූර්ණ ගැණුම් මුදල ගෙවා නිම කිරීමෙන් පසුව වහාම මෙම ධීවර යාත්‍රාව ගැණුම්කරු භාරයට ගත යුතුයි.

වැඩිදුර විස්තර සඳහා 2014.06.27 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2014.06.13 වැනි දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකුරල් පුවත්පත් බලන්න.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් ලියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ කළමණාකරු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 2448448 හෝ 0117448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 - 672082, ෆැක්ස් අංකය : 2871184.

09-147

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | *රු.* | *ශ.* |
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... | ... | ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැලකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| **සැප්තැම්බර්** | 2016.09.02 | සිකුරාදා | 2016.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.09 | සිකුරාදා | 2016.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.15 | බ්‍රහස්පතින්ද | 2016.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.23 | සිකුරාදා | 2016.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.30 | සිකුරාදා | 2016.09.15 | බ්‍රහස්පතින්ද | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2016.10.07 | සිකුරාදා | 2016.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.14 | සිකුරාදා | 2016.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.21 | සිකුරාදා | 2016.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.28 | සිකුරාදා | 2016.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2016.11.04 | සිකුරාදා | 2016.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.11.11 | සිකුරාදා | 2016.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.11.18 | සිකුරාදා | 2016.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.11.25 | සිකුරාදා | 2016.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2016 ජූනි මස 21 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.